CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

**කෙටි සටහන**

# දේශපාලන පලිගැනීම් විමර්ශන කොමිසන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තු අනුමැතිය ඉල්ලීමේ යෝජනාව

***2021 අප්‍රේල් 19-*** 2015 ජනවාරි 8 දා සිට 2019 දෙසැම්බර් 19 දින දක්වා කාලය තුළ දේශපාලන පලිගැනීම් පිළිබඳ චෝදනා විමර්ශන කිරීම සඳහා වූ කොමිසන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ඉල්ලීමේ යෝජනාවක් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් 2021 අප්‍රේල් 9 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබී ය. එම යෝජනාව මෙම සතියේ පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිතව ඇත.

2020 ජනවාරි 9 දා පිහිටුවනු ලැබූ පරීක්ෂණ කොමිසන් සභාවේ වාර්තාව 2020 දෙසැම්බර් 8 දා ජනාධිපතිවරයා වෙත භාරදෙනු ලැබී ය. පරීක්ෂණ කොමිසමේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සහ පරීක්ෂණ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදීම 2021 ජනවාරි 18 දින සිදුවීය. ඒ අනුව, පරීක්ෂණ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති විමර්ශන කොමිසන් සභාවක් 2021 ජනවාරි 29 දා පිහිටුවනු ලැබී ය.

පරීක්ෂණ කොමිසමේ අංක 8 දරන අයිතමයේ (දූෂණ විරෝධී කමිටුවට අදාළ) සඳහන් වන වගඋත්තර කරුවන් පිළිබඳව විමර්ශන කොට ඔවුන්ගේ සිවිල් අයිතිය අහෝසි කළ යුතු දැයි නිර්දේශ කිරීම විශේෂ ජනාධිපති විමර්ශන කොමිසමට පවරනු ලැබී ය. පරීක්ෂණ කොමිසන් සභා වාර්තාවේ අංක 8 දරන එම අයිතමය අතහැර, එහි අංක 9 සහ 10 ලෙස සඳහන් අයිතමවල තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලීම අප්‍රේල් 9 දා සභාගත කළ යෝජනාව මගින් සිදුකොට තිබේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාව, රාජ්‍ය සේවා කොමිසම, පොලිස්පති තුමා, අදාළ අමාත්‍යංශ භාර ඇමතිවරුන් සහ අමාත්‍යංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත කළ, අයිතම අංක 9 යටතේ සඳහන් පැමිණිලි පිළිබඳව පරීක්ෂණ කොමිසමේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ද මෙයට ඇතුළත් ය.

මෙම නඩුවලට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට, නීතිඥයන්ට, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, සාක්ෂිකරුවන්ට සහ සම්බන්ධ වූ වෙනත් අයට එරෙහිව අපරාධ නඩු පැවරීම ආරම්භ කිරීමට ද පාර්ලිමේන්තුවේ අනුමැතිය යෝජනාව මගින් ඉල්ලා ඇත. අධිකරණයේ දැනට විභාග වන නඩු ගණනාවක්,

අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ පාලනය යටපත් කරමින් නිෂ්ප්‍රභා කිරීමට ද එමගින් අනුමැතිය ඉල්ලා ඇත.

පාර්ලිමේන්තුවේ මෙම යෝජනාව සම්මත වුවහොත් හා ඉන්පසු එය ක්‍රියාත්මක කළහොත් නීතිමය සහ දේශපාලන යන අංශ දෙකෙන් ම ව්‍යාකූලතා රාශියක් ඇතිවිය හැකි ය. එබඳු යෝජනාවක සහ ඒ අනුව ගන්නා ක්‍රියා මාර්ගයක බලපෑම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සංක්ෂිප්ත නිරීක්ෂණ මෙම කෙටි සටහනින් ඉදිරිපත් කරනු ලබයි. පරීක්ෂණ කොමිසම, විශේෂ ජනාධිපති විමර්ශන කොමිසන් සභාව, සහ ඒවායේ පුළුල් බලපෑම පිළිබඳව විවේචනාත්මක වාර්තාවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ළඟදීම නිකුත් කරනු ලබනවා ඇත.

**අධිකරණයේ ස්වාධීනත්වය**

පරීක්ෂණ කොමිසම, විශේෂ ජනාධිපති විමර්ශන කොමිසන් සභාව, සහ යෝජනාවේ ද  හරය ලෙස ඇති වැරදි අදහසක් වන්නේ, අදාළ කාලය තුළ අධිකරණය ස්වාධීන සහ අපක්ෂපාති ආකාරයට සොයාගැනීම් සිදු නොකළ බව යි. අධිකරණ සහ විනිශ්චය සභාවල ස්වාධීන ක්‍රියාකාරීත්වයට මෙන් ම, අධිකරණ ක්‍රමය පිළිබඳව මහජන විශ්වාසය යන දෙකට ම මෙය ප්‍රතිවිරෝධී වෙයි. පරීක්ෂණ කොමිසමේ සොයාගැනීම්වලට පිළිගැනීමක් ලබා දුන හොත් ඉන් සිදුවන්නේ ස්ථාපිත අධිකරණ ක්‍රියාවලියට බාහිර ක්‍රියාවලියක් මගින් අධිකරණයේ තීන්දු නැවත තක්සේරු කිරීමකි. මීට පෙර සිදු නොවූ ආකාරයේ පියවරක් වන මෙමගින්, මහජනයාගේ ස්වාධිපත්‍යය උල්ලංඝනය වනු ඇත්තේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති ආකාරයට මහජනයාගේ අධිකරණ බලය අධිකරණය මගින් ක්‍රියාත්මක වීම සිදු නොවීමෙනි. මෙය අධිකරණයේ ක්‍රියාකාරීත්වය යටපත් කිරීමට විධායකය දරන අලුත් ම උත්සාහය ලෙස සටහන් කරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ආණ්ඩුවේ එක් එක් අංශ ස්වාධීනව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා මෙයට ශක්තිමත් ලෙස විරුද්ධ විය යුතු බව ද ප්‍රකාශ කරයි.

තව ද, මෙමගින් නීති ක්‍රියාත්මක කිරීමේ සහ අධිකරණ අංශයේ සමස්තයක් ලෙස විශාල ව්‍යාකූලතාවක් ඇතිවිය හැකි අතර ස්වාධීනව වැඩ කළ යුතු ආයතන තව දුරටත් දේශපාලනීකරණය සිදුවනු ඇත. තමන්ගේ රාජකාරී ඉටු කිරීම සම්බන්ධයෙන් විමර්ශකයන්ට සහ නඩු පවරන්නන්ට එරෙහිව දේශපාලන වුවමනා අනුව පියවර ගැනීමට මෙමගින් ඉඩ කඩ විවර වනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස විමර්ශකයන් සහ නඩු පවරන්නන් අතර බියපත් වාතාවරණයක් සහ අඩපනවීමක් සිදුවිය හැක්කේ දේශපාලන බලපෑම සහිත තැනැත්තන් සම්බන්ධ වත්මන් සහ අනාගත සියලු විමර්ශන අපහසු කරමිනි. පලිගැනීමට ලක්වනු ඇතැයි බිය හේතුවෙන් ඉදිරියට පැමිණීම වළක්වනු ලැබීමෙන් ,වින්දිතයන් සහ සාක්ෂිකරුවන් මත අහිතකර බලපෑම් ඇතිවිය හැකි ය.

තව ද, දක්ෂ අධිකරණවල සොයාගැනීම් ප්‍රශ්න කිරීම මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කොට ඇති සහ අධිකරණ මගින් තහවුරු කොට ඇති, සාධාරණ නඩු විභාගයකට සහ නියමිත ක්‍රියාවලියකට ඇති අයිතිය අවමානයට ලක්කරයි.

## ක්‍රියාවලිය දේශපාලනීකරණය කිරීම

දේශපාලන පලිගැනීමේ සිදුවීම් පිටුදැකීමේ අවශ්‍යතාව පසෙක තිබිය දී, දේශපාලනීකරණයවීම පිලිබඳ විවේචනයන්ට පරීක්ෂණ කොමිසම ද ලක් වූ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිල්ලට ගනියි. දේශපාලන පලිගැනීම් සම්බන්ධයෙන් සොයාගැනීමට භාවිත කළ ක්‍රියා පටිපාටිය, එහි වරම සහ සොයාගැනීම් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගණනාවකගේ සහ වෙනත් අයගේ විවේචනයට සහ අභියෝගයට ලක් වී ය. යොදාගත් නිශ්චිත ක්‍රියාවලිය, නීතිමය වශයෙන් ලැබුණු වරමට පිටින් ක්‍රියාත්මක වීම, දේශපාලන ප්‍රශ්නවලට අදාළ අධිකරණ සොයාගැනීම් සියල්ල ම පාහේ ආපසු හැරවීම, ඇතුළු බරපතළ අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍ර ගණනාවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිල්ලට ගනියි. මෙය පරීක්ෂණ කොමිසම දේශපාලනීකරණය පිලිබඳ විවේචනයන්ට හේතු වී තිබේ.

## බලය වෙන් කිරීම

යෝජනාවේ නීතිමය වලංගුතාවය කුමක් වුවත්, සභාගත කොට ඇති යෝජනාව සම්මත වුවහොත්, එමගින් පරීක්ෂණ කොමිසම, විශේෂ ජනාධිපති විමර්ශන කොමිසන් සභාව සහ පාර්ලිමේන්තුව විසින් අධිකරණ බලය අභිබවා යාමක් සිදුවන අතර එය ව්‍යවස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදයක ඇති බලය වෙන්කිරීම සහ නීතියේ පාලනය පිලිබඳ මූලධර්ම උල්ලංඝනය වනු ඇත. දෙවන අනුමානයකට සහ අධිකරණයේ තීන්දු ආපසු හැරවීමට ව්‍යවස්ථාදායකයට ඉඩ දුන හොත් එමගින් අධිකරණය යටපත් වීමක් මෙන් ම, ජනතාවගේ අධිකරණ බලය ව්‍යවස්ථාදායකය විසින් කොල්ලකෑම ද සිදුවෙයි.

**අංක 09 අයිතමය යටතේ ඇති පැමිණිලි ඇතුළත් ලැයිස්තුවක්, පහසුව සඳහා, පහත පලවෙයි.**

1. අද්මිරාල් වසන්ත කරන්නාගොඩ සහ වෙනත් අය සම්බන්ධයෙන් ඇති පැහැරගෙන යාමේ චෝදනා, පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් ඝාතනය, වසීම් තජුදීන්ගේ මරණය, ලසන්ත වික්‍රමතුංග ඝාතනය, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසිංහම් ඝාතනය, වැලිකඩ හිරගෙදර ඝාතන, මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් වීම සහ කීත් නොයාර් පැහැරගෙන යාම ඇතුළු නඩු ගණනාවක අපරාධ පරීක්ෂණවලට එරෙහි පැමිණිලි
2. දිවි නැගුම දෙපාර්තමේන්තුව, සංචාරක සංවර්ධන අධිකාරිය, සමුපකාර සංස්ථාව (සතොස), එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වැනි ආයතන වල මූල්‍ය අක්‍රමිකතා පිලිබඳ චෝදනා සහ මහජන මුදල් අවභාවිතය පිලිබඳ විමර්ශනවලට එරෙහි පැමිණිලි
3. පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිලට එරෙහිව ඇති වංචාකිරීම සහ අවභාවිත චෝදනා පිළිබඳව විමර්ශනයට එරෙහිව පැමිණිල්ල
4. හිටපු ඇමති රෝහිත බෝගොල්ලාගම විසින් මහජන මුදල් අවභාවිත කරනු ලැබීමේ චෝදනා විමර්ශනයට එරෙහි පැමිණිල්ල
5. කාල්ටන් ක්‍රීඩා ජාලය ආරම්භ කිරීමේ දී මහජන දේපළ අවභාවිතය ගැන විමර්ශනයට එරෙහි පැමිණිල්ල

6. තාරුණ්‍යයට හෙටක් සංවිධානයට වෙන්කර තිබූ මුදල් අවභාවිත චෝදනා සම්බන්ධයෙන් විමර්ශනයට එරෙහි පැමිණිල්ල
7. දුමින්ද සිල්වා සිරගත කිරීමට එරෙහි පැමිණිල්ල
8. විද්‍යා ඝාතන නඩුවේ ප්‍රධාන සැකකරුට පලායාමට ආධාර කිරීමේ චෝදනාව මත උතුරු පළාතේ නියෝජ්‍ය පොලිස්පතිගේ වැඩ අත්හිටුවීමට එරෙහි පැමිණිල්ල
9. අවන්ට් ගාඩ් මතභේදාත්මක සිදුවීම පිලිබඳ විමර්ශනයට එරෙහි පැමිණිල්ල
10. රක්නා ආරක්ෂක ලංකා සමගම පිළිබඳව විමර්ශනයට එරෙහි පැමිණිල්ල
11. හොරෙන් ගෙනා රත්රන් නාවික හමුදාවට මුදාහැරීම පිලිබඳ පරීක්ෂණයට එරෙහි පැමිණිල්ල
12. ලිට්‍රෝ ගෑස් නඩුවේ දී මහජන මුදල් අවභාවිත චෝදනාවලට එරෙහි පැමිණිල්ල
13. යුක්රේනය සමග මිග් ගුවන් යානා ගනුදෙනුව සම්බන්ධ විමර්ශනයට එරෙහි පැමිණිල්ල
14. ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපති, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ / රූපවාහිනී සංස්ථාවේ සේවකයින්, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, හිටපු විදුහල්පති උපාලි ගුණසේකර, ඇතුළු රජයේ නිලධාරීන් ගණනාවකට එරෙහි විනය ක්‍රියා සහ පරීක්ෂණවලට එරෙහි පැමිණිලි
15. හයට් රීජන්සි නඩුවට අදාළ මුදල් වංචාකාරී ලෙස මාරුකිරීමේ චෝදනාවට එරෙහි පැමිණිල්ල

**අංක 10 අයිතමයට අදාළ පැමිණිලිවලට පහත සඳහන් දෑ ඇතුළත් ය**

1. ඩී. ඒ. රාජපක්ෂ පදනම මගින් ඉඩමක් මිල දී ගැනීම ගැන විමර්ශනයට එරෙහි පැමිණිල්ල
2. හිටපු ආර්ථික සංවර්ධන ඇමති බැසිල් රාජපක්ෂ මහතා විසින් මහජන මුදල් යොදවා මිල දී ගනු ලැබ ඇතැයි චෝදනා එල්ල වන මල්වානේ අක්කර 16 ක ඉඩම පිලිබඳ විමර්ශනයට එරෙහි පැමිණිල්ල
3. කොළඹ මහනගර සභාවේ නාගරික කොමසාරිස්ට එරෙහි මහජන මුදල් අවභාවිත චෝදනාවට එරෙහි පැමිණිල්ල
4. විවිධ චෝදනා නිසා රජයේ නිලධාරීන් ගණනාවක් ඉවත් කිරීමට එරෙහි පැමිණිලි